ඔක්තෝබර් 08 වෙනි දින අද දෙරණ රාත්‍රී ප්‍රධාන පුවත් විකාශය තුළ සඳහන් වූයේ "සහරාන්ට බදියුදීන් සොහොයුරු කළ උදවු ගැන යළි අනාවරණ වේ" යනුවෙනි. කෙසේ වුවත් පුවත් විකාශය තුළ ඊට අදාළව සඳහන් වූයේ, හිටපු හමුදාපතිවරයා විසින් මේ සම්බන්ධයෙන් සිදුකල කරුණු දැක්වීමකි. මේ පිළිබඳව ප්‍රේක්ෂකයන් ලෙසින් අපට පැන නගිනා ගැටළු කිහිපයකි.

1) බදියුදීන් සොහොයුරු සහරාන් හට උදවු කළ බවක් නීතිය ඉදිරියේ තහවුරු වී තිබේද?

2) ඒ සම්බන්ධයෙන් වන නීති සහ අධිකරණමය ක්‍රියාමාර්ගයන් අවසන් වී, ඒ සඳහා තීන්දුවක් ලැබී තිබේද?

3) එසේ නොමැති නම්, මාධ්‍යයක් මගින් බදියුදීන් සොහොයුරු සහරාන්ට උදවු කළ බව පවසන්නේ කුමන පදනමකින්ද?

4) තවමත් නීතිය ඉදිරියේ විභාග වෙමින් පවතින මෙවන් කරුණක්, නිශ්චිතවම සිදුවූ බව හැඟවෙන මෙවන් ප්‍රකාශයක් මාධ්‍යයක් මගින් සිදුකිරීම ගැටළුකාරී නොවේද?

5) යම් අයෙකු නීතියෙන් වරදකරුවෙකු බවට තීන්දු වන තුරු ඔහු/ඇය සැකකරුවෙකු ලෙසින් පමණක් සැලකිය යුතු නොවන්නේද?

මේ සම්බන්ධයෙන් ඔබේ අදහස් කවරේද?

**#MediaEthicsSL #lka #TV #SinhalaNews #TVDerana**